5 වියැති බාලවයස් දැරියක අපයෝජනය කිරීමේ චෝදනාවක් මත ටියුෂන් ගුරුවරයෙකු අත්අඩංගුවට පත් වීමේ පුවතක්, මව්බිම සහ දිනමිණ පුවත්පත් (දෙසැම්බර් 02, 2022) වාර්තා කර තිබුණේ මේ ආකාරයෙනි.

* මව්බිම - "15 පාසල් දැරිය අපයෝජනය කළ ටියුෂන් ගුරා රිමාන්ඩ්"

* දිනමිණ - "වයස 15 ක දැරියකට අතවර කළ උපකාරක පන්ති ගුරුවරයා රිමාන්ඩ්"

1) සමාජය තුළ භාවිතා වන භාෂාව හැඩගැස්වීමට මාධ්‍ය දායක වේ. සමාජයේ චින්තනය හැඩගැස්වීම සඳහා එම සමාජය තුළ භාවිතා වන භාෂාවද දායක වේ. ඒ අනුව, "ගුරා" වැනි යෙදුම් මාධ්‍ය විසින් භාවිතා කිරීම යෝග්‍යද?

2) එක් සැකකරුවෙකු හැඳින්වීමට "ගුරා" යන යෙදුම භාවිතා කිරීමෙන්, සමස්ත වෘත්තියකටම අපහාසයක් එල්ල නොවන්නේ ද?

3) මව්බිම සිරස්තලයේ දැක්වෙන "ගුරා" යන යෙදුම වෙනුවට, දිනමිණ සිරස්තලයේ දැක්වෙන "ගුරුවරයා" යන
යෙදුම වඩාත් යෝග්‍ය නොවේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න